නිපුණතාව 5.0 - මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.

නිපුණතා මට්ටම 5.1 - ගිණුම්කරණ සංකල්ප විග්‍රහ කරයි.

- මූල්‍ය ප්‍රකාශන මූලිකාංග හඳුනාගැනීමේ දී සහ මැනීමේ දී යොදා ගන්නා පොදුවේ පිළිගත් මූලධර්ම ගිණුම්කරණ සංකල්ප ලෙස හැඳින්වේ.
- ව්‍යාපාර විසින් සකස් කරන ගිණුම්කරණ තොරතුරුවල ඒකාකාරී ස්වභාවයක් තිබිය යුතුය.එය ආරක්ෂා කර ගැනීම සඳහා ගිණුම්කරණ සංකල්ප යොදා ගනියි.
- මූල්‍ය ගිණුම්කරණයේ දී අදාළ කර ගන්නා ගිණුම්කරණ සංකල්ප රාශියක් ඇත.ඒවා යොදා ගනිමින් සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම්කරණ තොරතුරු සැසඳීම කළ හැකිය.
- ගිණුම්කරණ තොරතුරු සකස් කිරීමේ දී භාවිතයට ගන්නා ගිණුම්කරණ සංකල්ප පහත දැක්වේ.

| | |
|---|---|
| 1.ඒකක සංකල්පය | 8.උපලබ්ධි සංකල්පය |
| 2.අඛණ්ඩ පැවැත්මේ සංකල්පය | 9.ගැලපුම් සංකල්පය |
| 3.කාලච්ඡේද සංකල්පය | 10.ආරක්ෂණ සංකල්පය/විචක්ෂණ සංකල්පය |
| 4.මූල්‍ය මිනුම් සංකල්පය | 11.ප්‍රමාණාත්මක සංකල්පය/වැදගත්බවේ සංකල්පය |
| 5.උපචිත සංකල්පය | 12.ඓතිහාසික පිරිවැය සංකල්පය |
| 6.සංගතතා සංකල්පය/අනුරූපිතා සංකල්පය | 13.අනාවරණ සංකල්පය/හෙළිදරව් කිරීමේ සංකල්පය |
| 7.යථාරූපී සංකල්පය/හරාත්මක බවේ සංකල්පය | |

1.පහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීමේ දී සම්බන්ධ වන ගිණුම්කරණ සංකල්ප නම් කරන්න.

1.)ක්ෂය වාර්තා කිරීම.

2.)තොගය වාර්තා කිරීම.

3.)වියදම් වාර්තා කිරීම.

4.)ආදායම් වාර්තා කිරීම.

5.)දේපළ පිරියත හා උපකරණ